සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සතිය - 20

විෂය - ගිණුම්කරණය

ශ්‍රේණිය - 12

සකස් කළේ - එච්.පී.කේ.ජේ.එම්.පතිරණ මිය,ර/ෆර්ගසන් උසස් විදුහල

නිපුණතාව 4.0 - මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.

නිපුණතා මට්ටම 4.8 - පාලන ගිණුම් හා උපලෙජර් අතර සම්බන්ධතාව දක්වයි.

සුමේධගේ ව්‍යාපාරයේ 2021/01/31 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය රු.35,000කි.එදිනට පාලන ගිණුමේ ශේෂය සමඟ ශේෂ ලැයිස්තුවේ ශේෂය එකඟ නොවීය.එම වෙනසට පහත හේතු බලපා ඇත.

1.ගැනුම් ජර්නලයේ එකතුව රු.1,500ක් අඩුවෙන් ගණනය කර ඇත.

2.සඳුන්ට ආපසු යැවූ රු.2,300ක භාණ්ඩ,ජර්නලයේ නිවැරදිව සටහන් කළත් ඔහුගේ පෞද්ගලික ගිණුමේ සටහන් කර තිබුණේ රු.1,300ක් ලෙසයි.

3.ණයහිමියෙකුට ගෙවූ රු.3,400ක මුදල නිවැරදිව පාලන ගිණුමේ සටහන් කළත් අදාළ ණයහිමි ගිණුමේ සටහන් කර ඇත්තේ රු.4,300ක් ලෙසයි.

4.ලද වට්ටම් රු.200ක් පාලන ගිණුම තුළ සටහන් කර නැත.

5.ඉසුරුට ගෙවූ රු.7,500ක මුදල ගෙවීම් ජර්නලයේ රු.5,500ක් ලෙස සටහන් කර ඇත.

6.විදුරගේ ණයට ගැනුම් රු.8,000ක් වූ ඉන්වොයිසිය මග හැරී ඇත.

අවශ්‍ය වන්නේ,

1.)2021/01/31 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය,ණයහිමි ශේෂ ලැයිස්තුවේ දැනට පවතින ශේෂය සමඟ සැසඳීමේ ප්‍රකාශනයක්

2.)සංශෝධිත ණයහිමි පාලන ගිණුම

3.)වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන්